**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය - 2022**

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1979 අංක 45 දරන ජාතික වැව්ලි කළමනාකරණ ආයතන පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 හි 9 ඡේදයට පටහැනිව ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට රු.908,489 ක ඉතුරුම් ගිණුම් ශේෂ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ ගිණුම්ගත නොකර වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | වෘත්තීය සාමාජික ගාස්තු අයකර ගැනීම වෙනුවෙන් පවත්වා ගෙන යන ඉතුරුම් ගිණුමේ රු 908,488.96 .ක ශේෂය වෙනත් ජංගම වත්කම් වලින් ඉවත් කර මුදල් හා මුදල් සමාන දෑ යටතට මාරු කර නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ඉතුරුම් ගිණුම් ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ ගිණුම් ප්‍රතිපත්තිවල පාඨමාලාවලින් ලද ආදායම හඳුනා ගැනීම, අදාළ වර්ෂය තුළ අවසන් කළ මොඩියුල ගණන හෝ පුහුණු පාඨමාලාවේ ඵලදායි මාස ගණන අනුව සිදු කරන බව දක්වා තිබුණද මොඩියුල ගණන පදනම් කරගෙන ආදායම් හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණු අතර ඵලදායි මාස ගණන පදනම් කර ගැනීමේදී පාඨමාලා ආරම්භ කළ නිශ්චිත දිනය, පාඨමාලා කාලය දීර්ඝ වීම, ඌන සාමාර්ථ, ශිෂ්‍යයන් පාඨමාලා අතහැර යාම, පාඨමාලා මාරු කිරීම වැනි අවස්ථාවලදී ආදායම හඳුනා ගන්නා ආකාරය, ගිණුම්කරණ ප්‍රතිපත්තිය තුළ නිශ්චිතව දක්වා නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 22,512,139 ක අධ්‍යයන හා වෘත්තීය පාඨමාලා ආදායම, රු.9,894,479 ක ලැබිය යුතු පුහුණු පාඨමාලා ආදායම සහ රු. 3,793,667 ක කලින් ලද පාඨමාලා ගාස්තු යනාදියෙහි නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව පාඨමාලාවන් හි ආදායම හඳුනා ගැනීමේ ක්‍රමවේදය ලෙස කාල පදනම පමණක් ඉදිරියට සැලකිල්ලට ගනු ලබන අතර, මොඩියුල ගණන පදනම්ව ආදායම හඳුනා ගැනීමේ පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>මේ අනුව පාඨමාලාව ආරම්භ කරන ලද මාසය අනුව පාඨමාලා කාල සීමාව සැලකිල්ලට ගෙන ආදායම් හඳුනා ගැනීම ගිණුම් ප්‍රතිපත්ති වලට ඇතුළත් කරන අතර කාලය දීර්ඝ වීම, පාඨමාලාව අත්හැර යාමේදී සිදුවන බලපෑම, ඌන සමත් සිසුන්ගේ පාඨමාලා ගාස්තු පිළිබඳව හා පාඨමාලා මාරු කරන සිසුන්ගේ ආදායම හඳුනා ගන්නා ලද ආකාරය පිළිබඳව 2023 ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව සඳහන් කිරීමට කටයුතු කරනු ඇත. | පාඨමාලාවලින් ලැබෙන ආදායම් හඳුනා ගැනීම සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සංශෝධනය කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2019 වර්ෂයේ රු.851,800 කට මිලදීගෙන තිබුණු රන්කාසි 10ක් 2022 දෙසැම්බර් 31 දිනට රු.2,309,175 කට තක්සේරු කර එම වටිනාකම වෙනත් ජංගම වත්කම්හි "රන් තැන්පතු ගිණුමට" හර කර රඳවා ගත් ඉපයුම් ගිණුමට බැර කර තිබුණි. වෙළඳපළ වටිනාකම මත ඇතිවූ මෙම අධි වටිනාකම වූ රු.1,457,375 ක් සංචිත ගිණුමට බැර කිරීම වෙනුවට රඳවාගත් ඉපයුම් ගිණුමට බැර කිරීම හේතුවෙන් රඳවාගත් ඉපයුම් වටිනාකම රු.1,457,375 කින් අධි ගණනය වී තිබුණි. | 2019 වසරේ දී මෙම රන් කාසි සේවකයින් වෙත බෙදා දීම සඳහා සිදු කරන ලද වියදමක් බැවින්, එම වර්ෂයේදී වියදමෙන් ලියා හැර ඇත. මෙම රන් කාසි සේවකයින් වෙත බෙදා දීම කළමනාකාරිත්වය මඟින් අත්හිට වූ බැවින්, එම රත්‍රං කාසි වටිනාකම 2022.12.31 දිනට පැවතියා වූ මහ බැංකුව විසින් ප්‍රකාශිත වෙළඳපල වටිනාකම අනුව ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කර ඇත. | රන්කාසි තක්සේරුවේදී ඇති වූ ලාභය සංචිත ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) ආයතනය විසින් පාඨමාලා හදාරන ශිෂ්‍යයන් සඳහා සියයට 10ක සේවා ගාස්තුවක් සහිතව නේවාසිකාගාරය, ආහාරපාන හා නවාතැන් පහසුකම් සැපයීමෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.25,016,678ක ආදායමක් උපයා තිබුණද එහි ඇතුළත් සේවා ගාස්තු ආදායම අඩුකල පසු ශුද්ධ ආදායම වූ රු.22,556,427 ක් පමණක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත පහසුකම් කුලියට සැපයීමෙන් ආයතනය 2022 වර්ෂයේ දී ආදායම රු.22,556,426 ක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ සඳහන් කර ඇත. ගිණුම්ගත කරන ලද මුළු බාහිර පහසුකම් සැපයීමෙන් ලද ආදායමින් සියයට 10 ක සේවා ගාස්තු අඩුකර ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත. | ආදායම් ගිණුම් ගත කිරීමේදී සේවා ගාස්තු ආදායම ඇතුළත්ව මුළු ආදායම ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ)2022 දෙසැම්බර් 31 දිනට වැවිලි කළමනාකරණ ආයතනයේ පූර්ණ සාමාජිකයින් 122 දෙනෙකුගෙන් රු.1,521,000 ක් ද ආශ්‍රිත සාමාජිකයින් දස දෙනෙකුගෙන් රු.88,100 ක්ද ලෙස මුළු සාමාජික ගාස්තු රු.1,609,100 ක් ලැබිය යුතුව තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | 2022.12.31 දින මුළු සාමාජිකයින් 216 ක් සිටි නමුත් සාමාජිකයින් දිගුකාලීන ගාස්තු නොගෙවා අක්‍රියව සිටීම සහ ජීවත්ව සිටී ද යන්න තහවුරු කිරීමේ ගැටළු මත ලැබිය යුතු සාමාජික ගාස්තු පිළිබඳව ගිණුම්ගත කිරීම අපහසුතා පැවැතීම හේතුවෙන් මුදල් ලබාදීමේ දී ලැබෙන පදනම මත සාමාජික ගාස්තු ගිණුම් ගත කර ඇත. | වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ)මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය අනුව සාමාජික ගාස්තු ආදායම රු.173,330 ක් වුවද 2022 වර්ෂයට අදාළ සාමාජික ගාස්තු ආදායම රු.569,000 ක් වූ බැවින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ සාමාජික ගාස්තු ආදායම රු.395,670 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී දැනට ක්‍රියාකාරි තත්ත්වයේ පසුවන සාමාජිකයින් 105 දෙනාගේ තොරතුරු අනුව සාමාජික මුදල් ලැබීම ගිණුම්ගත කර පෙන්වා දී ඇති අඩුපාඩුව නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | මූල්‍ය ප්‍රකාශනවල වාර්ෂික සාමාජික ගාස්තු ආදායම නිවැරදිව දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මතුගම, අගලවත්ත ඩාවින් ෆීල්ඩ් වතුයායේ පිහිටි අක්කර 10ක ඉඩම රු.75,405ක නාමික අගයකට 1999 සැප්තැම්බර් 24 දින ආයතනය වෙත පවරා තිබුණු අතර දැනට අක්කර 7 ½ ක් ආයතනය සතුව තිබුණද එහි නාමික අගය හෝ සාධාරණ අගය ගණනය කර සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. මෙම ඉඩම කිසිදු කාර්යයකට නොයොදා ඌන උපයෝජිතව පවතින අතර එහි 2023 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.15,080,000 ක් විය. | මෙම ඉඩමෙන් අක්කර 2 ½ ක් ප්‍රමාණය ජාතික භාෂා ආයතනය වෙත අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ඔප්පුවක් මගින් පවරා දී ඇත. මෙම ඉඩමේ අක්කර 7 ½ ක් වූ ඉතිරි කොටස තක්සේරු කිරීම සඳහා ක්‍රියා කර ඇති අතර 2021 වර්ෂයේ දී තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඒ පිළිබඳ ඉල්ලීමක් කර ඇත. | මතුගම, අගලවත්ත ඩාවින් ෆීල්ඩ් වතුයායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර මෙම ඉඩම ඵලදායි කටයුත්තකට යෙදවිය යුතුය. |
| (ඊ) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් නේවාසිකාගාර ජලනල පද්ධතිය හා මලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ කෙරීගෙන යන වැඩ වටිනාකම තුළ, වෙනම පෙන්විය යුතු තේ නිමවුම් වර්ගීකරණය යන්ත්‍රයේ ප්‍රසම්පාදනයට අදාළ (රොටර් වේන්) රු.319,975 ක කෙරීගෙන යන වැඩ ද ඇතුළත් කර තිබුණි. | 2022.12.31 දිනට මෙම ජලනල පද්ධතිය හා මලාපවාහන පද්ධතිය ප්‍රතිසංස්කරණය වෙනුවෙන් කෙරීගෙන යන වැඩ ලෙස රු.10,667,529 ක අගයක් ඇතුළත් කර ඇති අතර ඉන් රු.319,575/- ක් වූ ඉගෙනුම් මධ්‍යස්ථානයේ රොටර් වේන් යන්ත්‍රය වෙනුවෙන් ගෙවන ලද මුදලක් ද අන්තර්ගතය. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන වැඩ නිවැරදිව වර්ගීකරණය කර දැක්විය යුතුය. |
| (උ) ආයතනයේ තේමා ගීතය සඳහා වීඩියෝවක් නිර්මාණය කිරීම සහ තේමා ගීතය නැවත නිර්මාණය කිරීම යන කාර්යයන් සඳහා බාහිර පාර්ශවයක් වෙත පිළිවෙලින් රු.755,000 ක් හා රු.295,000 ක් ලෙස එකතුව රු.1,050,000ක් 2022 වර්ෂයේදී ගෙවා තිබුණු අතර මූල්‍ය ප්‍රකාශන වල මෙම වටිනාකම අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගැනීම වෙනුවට පුහුණු වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවී පුහුණු වියදම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි. | ආයතනයේ තේමා ගීතය සහිත ආයතනයේ කාර්යභාරය පිළිබඳ ප්‍රවර්ධන වීඩියෝවක් නිර්මාණය කිරීම සඳහා පිළිවෙලින් රු.755,000 ක් හා රු.295,000 ක මුදලක් අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන එය මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වෙනම දැක්විය යුතුය. |
| (ඌ) සිව්මහල් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා පුද්ගලික සමාගමක් වෙත 2021 වර්ෂයේදී එකතුව රු.41,324,784 ක (වැට් රහිත ) අත්තිකාරම් ලබාදී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට වූ අවසන් බිල්පතින් අත්තිකාරම් මුදලින් රු.30,798,742 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර | සිව් මහල් දේශන ශාලා සහ පර්යේෂණ ඒකකය ඇතුළත් නව ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත්තුවේ දෙවන අදියර සඳහා ගෙවූ අත්තිකාරම් මුදල රු.44,630,178 ක මුදලින් රු.3,305.979 ක මුදලක් වැට් මුදලක් වන අතර, ඒ අනුව ශුද්ධ ගෙවූ අත්තිකාරම් මුදල රු.41,324,728 කි. 2022.12.16 දිනැති Interim payment | ලැබිය යුතු සියලුම මුදල් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වනවිට තවදුරටත් අයකරගත යුතු රු.10,526,042ක ලැබිය යුතු ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | certificate No. 10 න් රු.30,798,742 ක මුදලක් කරන ලද වැඩ වලින් ආවරණය කර අවසන් කර ඇත. ඒ අනුව තවදුරටත් ආවරණය කර ගත යුතුව තිබූ මුදල රු.10,526,007 කි. | |
| (එ) සිව්මහල් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ අදියර I සහ අදියර II යටතේ රු.9,214,606 ක රඳවාගත් මුදල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | යථෝක්ත අදියර I හි රඳවා ගනු ලැබූ මුදල හා II අදියරේ ඉදිරිපත් කර තිබූ බිල්පතේ හිඟ රු.9,610,284.67 ක් යන දෙකෙහි එකතුව වන රු.15,598,792.45 ක අගය ගෙවිය යුතු වගකීම් ලෙස ගිණුම් ගත කර ඇත. | කොන්ත්‍රාත්තුවල රඳවාගත් මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළව අවසන් කරන ලද අධ්‍යයන හා වෘත්තීය පාඨමාලා හදාරන ලද සිසුන්ගෙන් මෙම ආයතනයට රු.455,000 ක් අයවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 ජනවාරි අවසන් වන විට කරන ලද පාඨමාලා රු.455,000 ක වටිනාකමින් යුතු පාඨමාලා ගාස්තු අයකර ගැනීමට හිඟව පැවතිණ. | හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ ආයතනික යහපාලනය පිළිබඳ වූ මාර්ගෝපදේශයේ 4.4 වගන්තිය | අභ්‍යන්තර විගණනය විසින් ආයතනයේ සියලු පරිපාලන ක්‍රියාකාරකම් ආයතනයේ සභාපතිවරයා වෙත වාර්තා කලයුතු වුවද ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික සංවිධාන ධූරාවලිය අනුව අභ්‍යන්තර විගණක ආයතනයේ අධ්‍යක්ෂවරයා යටතේ දක්වා තිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර පාලක මණ්ඩලයට වග කියන තනතුරක් ලෙස ධූරාවලියට අනුව කාර්ය මණ්ඩල සංයුතියේ අන්තර්ගතය. නිවැරදි සංවිධාන ව්‍යුහය සටහන වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර මෙම වරද නිවැරදි කරනු ඇත. | අභ්‍යන්තර විගණක පාලක මණ්ඩලයට වගකියන තනතුරක් ලෙස දැක්වෙන පරිදි සංවිධාන සටහන සංශෝධනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,548,607 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 19,202,306 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,653,699 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා පාරිභෝගික සේවා රු.4,612,060 කින්ද ධාරිතා සංවර්ධනය සමඟ පුහුණු වියදම් රු.5,920,260 කින්ද පහසුකම් කුලියට දීමේ වියදම් රු.10,052,711 කින් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 4 : 1 ක් හා 3 : 1 ක් වූ අතර පෙර වර්ෂයේදී එම අනුපාතයන් 7 : 1 ක් විය.2021 හා 2022 වර්ෂයන්හි කෙටිකාලීන තැන්පතු හා ආයෝජන පිළිවෙලින් රු.191,336,512 ක් හා රු.70,781,329 ක් වී තිබීම ජංගම අනුපාතයන් ඉහළ අගයක් ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා මාසිකව එක් නිවසකට රු.80,000 ක් බැගින් නිවාස දෙකක් 2021 පෙබරවාරි 01 දින සිට කුලියට ලබාගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.1,920,000 ක බද්දක් ගෙවා තිබුණි. බදු දීමනාකරුගේ එකඟත්වයන් ලබාගැනීමකින් තොරව 2022 ජූනි 30 හා 2022 දෙසැම්බර් 31 යන දින දෙක දක්වා ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අවිධිමත් ලෙස මාස 06ක කාලච්ඡේද දෙකක් සඳහා බදු කාලය දීර්ඝ කිරීම ඒකපාර්ශවීය ලිපි මඟින් සිදුකර තිබුණි. | බාහිර පුහුණු වැඩසටහන් පැවැත්වීම අරමුණු කොට ගනිමින් ආයතනය ආසන්නයේ ඇති එකවර 70 දෙනෙකුට පමණ නවාතැන් පහසුකම් සැපයිය හැකි මෙම නිවාස 2 ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත කුලී පදනම මත ලබාගෙන ඇත. | සම්පූර්ණ කුලී කාලය සඳහා ගිවිසුම් ගත විය යුතු අතර ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ආ) | ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණන කටයුතු අඛණ්ඩව සිදු කර ගෙන යාම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයක් එම අංශයට අනුයුක්ත කර නොතිබුණි. | ආයතනය මේ වන විටත් උග්‍ර සේවක හිඟයක් පවතින අතර බඳවා ගැනීම් නතර කිරීම හේතුවෙන් ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම අපහසු වී ඇත. රජයේ සංවර්ධන නිලධාරීන් කිහිප දෙනෙකු ආයතනයට අනුයුක්ත කර ඇති නමුත් එම ගණන ආයතනයේ ක්‍රියාකාරකම් නිසි ලෙස ඉටු කිරීමට ප්‍රමාණවත් නොවේ. සේවක මණ්ඩල බඳවා ගෙන අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත. | අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ((ඇ) | ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්‍රාම යන විට ලබාදීම සඳහා කැරට් 22 රන් පවුම් 13.5 g ක රන් කාසි 10 ක් 2019 මැයි 30 දින පෞද්ගලික ආයතනයකින් රු.851,800 කට මිලදීගෙන වියදම් ලෙස ලියාහැර තිබුණි. ආයතනික හා මූල්‍ය හේතු මත මෙම රන්කාසි බෙදා නොහැර වසර 3ක කාලයක් ආයතනයේ සේප්පුවේ රඳවා තිබුණු අතර භෞතික පරීක්ෂාවේදී කාසි 10 ක් තිබුණු නමුත් එම රන් පැහැති කාසි කැරට් 22 රත්‍රං ද යන්න තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 338/16 දරන පාලක මණ්ඩල පත්‍රිකාවට ලද අනුමැතියට අනුව වසර 20කට වැඩි සේවා කාලයක් සහිත සේවකයින් සඳහා කැරට් 22 රත්‍රං පවුම බැගින් 6 දෙනෙකු සඳහාද, රත්‍රං පවුම් 1 ½ බැගින් වසර 25 ඉක්මවූ එක් සේවකයකු සඳහාද වසර 30 ඉත්මවූ සේවකයන් 3 දෙනෙකු සඳහා පවුම් 2 බැගින් වූ මුළු රත්‍රං පවුම් 13.5ක් වූ රු.851,800ක කැරට් 22 රත්‍රං ස්වර්ණමහල් ආයතනයෙන් මිලදී ගෙන ඇත. | ආයතනයේ අරමුණු වලට අදාළ වියදම් පමණක් දැරිය යුතු අතර මෙම කාසි රන් කාසි බවට තහවුරු කිරීමේ හා තක්සේරු කිරීමේ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ජලනල පද්ධතිය හා මලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත රු.8,937,618ක මුදලකට කොන්ත්‍රාත්තුව භාර දී තිබුණු අතර එය 2021 සැප්තැම්බර් 21 දින ආරම්භ කර 2021 දෙසැම්බර් 19 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. 2022 සැප්තැම්බර් 08 දින දක්වා අවස්ථා 04 කදී ව්‍යාපෘති උපදේශකගේ නිර්දේශ මත ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් එම කාර්යය නිම කර නොතිබුණි. එසේම මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් සැපයුම්කරු ලබා දී තිබුණු රු.446,880ක කාර්ය සාධන සුරක්ෂණයද 2022 ජූලි 26 දිනෙන් අවසන් වී තිබුණු අතර ආයතනය විසින් කාර්ය සාධන සුරක්ෂණයේ දින දීර්ඝ කර ගැනීමට හෝ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව නියමිත කාල පරිච්ඡේදය ඇතුළත නිම කිරීමට කොන්ත්‍රාත්කරු අසමත් වූ අතර ඒ සඳහා රට තුළ පැවති Covid 19 වසංගත තත්වය, ඉන්ධන හිඟය, ඉදිකිරීම් අමුද්‍රව්‍ය හිඟය, රට තුළ පැවති ආර්ථික අස්ථාවරත්වය හේතු වූ බව කොන්ත්‍රාත් සමාගම විසින් ලිඛිතව ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව ව්‍යාපෘති උපදේශකගේ ද නිර්දේශය මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට ආයතනය කටයුතු කොට ඇත. 2022 වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබු අතර මේ වන විට ව්‍යාපෘතිය අවසන් කර ඇත. | කොන්ත්‍රාත්තුව නොපමාව නිම කරවා ගත යුතුය. කාර්ය සාධන ඇපකර මුදල් කර ගැනීමට හෝ එහි කාලය දීර්ඝ කර ගැනීමට පියවර නොගත් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ආ) | අතුරුගිරියේ පිහිටි ආයතනයේ ප්‍රධාන කාර්යාල නේවාසිකාගාරයේ ජලනල පද්ධතිය සහ මලාපවහන පද්ධතිය දින 90 ක කාලයක් තුළ ප්‍රතිසංස්කරණය | කොන්ත්‍රාත්තුව නියමිත කාල පරිච්ඡේදය ඇතුළත නිම කිරීමට කොන්ත්‍රාත්කරු අසමත් වූ අතර ඒ සඳහා රට තුළ පැවති COVID 19 වසංගත තත්ත්වය. ඉන්ධන | නීත්‍යානුකූල නොවූ රු.2,070,574 ක මිල විචලනය එය අනුමත කළ, නිර්දේශ කළ, |

| | | |
|---|---|---|
| කිරීම සඳහා කොන්ත්‍රාත්තු මිල ගණන් කැඳවා රු. 8,937,618 ක මුදලකට පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුට ලබා දී තිබුණු අතර රු.2,070,574 ක මිල විචලනයක් ඇතුළත්ව 2022 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.10,149,710 ක් සහතික කළ වැඩ සඳහා ගෙවා තිබුණි. ගිවිසුමේ කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව මිල විචලනය වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු. 2,070,574 ක මුදල නීත්‍යානුකූල නොවූ ගෙවීමක් ලෙස නිරීක්ෂණය කෙරේ. | හිඟය , ඉදිකිරීම් අමුද්‍රව්‍ය හිඟය , රට තුළ පැවති ආර්ථික අස්ථාවරත්වය හේතු වූ බව කොන්ත්‍රාත් සමාගම විසින් ලිඛිතව ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. 2022.12.31 වන දින වන විට මෙම කොන්ත්‍රාත්තුව සඳහා වැට් සමඟ රු.10,149,710 ක මුදලක් පමණක් ආයතන විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කොට ඇත.ව්‍යාපෘති උපදේශකවරයාගේ ද නිර්දේශය පදනම් කොට ගනිමන් මෙම ව්‍යාපෘතියේ මිල විචලනයන් සඳහා රු.2,070,574.00 ක් අනුමැතියක් අදාළ කොන්ත්‍රාත් සමාගම වෙත ලබා දී ඇත. | සහතික කළ නිලධාරීන්ගෙන් අයකළ යුතුය. |